## අධ්‍යාපන අමාත්‍යාංශය

## 2022 /2023 අධ්‍යයන වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම

01. 2022 / 2023 අධ්‍යයන වර්ෂය තුළ දී පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා ( අභ්‍යන්තර) ) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය , රජරට සහ යාපනය යන විශ්වවිද්‍යාලවල පැවැත්වේ.

03. (i) එක් එක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් හා බඳවා ගත හැකි උපරිම අයදුම්කරුවන් සංඛ්‍යාව පහත දක්වා ඇති අතර පාඨමාලාව සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් අයදුම් කළ හැකිය.

| අනු අංකය | විශ්වවිද්‍යාලය | මාධ්‍යය | බඳවා ගත හැකි උපරිම අයදුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කොළඹ විශ්වවිද්‍යාලය | සිංහල හා දෙමළ | සිංහල - 130<br>දෙමළ - 40 |
| 2 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | සිංහල | සිංහල - 100<br>දෙමළ - - |
| 3 | රජරට විශ්වවිද්‍යාලය | සිංහල | සිංහල - 50<br>දෙමළ - - |
| 4 | යාපනය විශ්වවිද්‍යාලය | දෙමළ | සිංහල - -<br>දෙමළ - 90 |

04. සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු / ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතු ය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකු වීම,

(ii) 2022.11.15 දිනට වයස අවුරුදු 50 ට නොවැඩි වීම,

(iii) මනා කායික හා මානසික සෞඛ්‍යයකින් සහ යහපත් චරිතයකින් යුක්ත වීම,

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව /උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත වෙනත් ආයතනයකින් උපාධියක් හෝ ඒහා සමාන මට්ටමේලා සැලකෙන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

(v) පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලැබ සේවය කිරීම.

(අ) * ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවය

* ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

* ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය

* ශ්‍රී ලංකා විදුහල්පති සේවය